**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව,**
**සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,**
**බත්තරමුල්ල.**

## ඩෙක්ස්ටොප් පරිගණක යන්ත්‍ර හා UPS යන්ත්‍ර සැපයීම හා ස්ථාපනය කිරීම ( 2024 වර්ෂය).

බත්තරමුල්ල, රජමල්වත්ත පාර, අංක 1200/6, 'මිහිකත මැදුර', ඉඩම් මහ ලේකම් කාර්යාලයේ පිහිටි ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් ඩෙක්ස්ටොප් පරිගණක යන්ත්‍ර හා UPS යන්ත්‍ර සැපයීම සහ ස්ථාපනය; ලංසු සඳහා ආරාධනා කරනු ලැබේ.

| අනු අංකය | භාණ්ඩ වර්ගය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | ඩෙක්ස්ටොප් පරිගණක යන්ත්‍ර | 111 |
| 02 | UPS යන්ත්‍ර | 111 |

02. මේ සඳහා උනන්දුවක් දක්වන යෝග්‍ය ලංසුකරුවන් සඳහා 2024 මාර්තු 20 දින සිට 2024 අප්‍රේල් 08 දින දක්වා කාර්යාලීය දිනයන්හිදී පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා කාලය තුල ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ ගිණුම් අංශය වෙත ලිඛිත ඉල්ලීමක් කර ලේඛන කට්ටලයක් සඳහා රු.5,000.00 ක ආපසු නොගෙවන ගාස්තුවක් ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ සරප් වෙත ගෙවීමෙන් ලංසු ලියවිලි ලබා ගත හැකිය. මෙම ගෙවීම මුදලින් පමණක් සිදු කළ යුතුය. ලංසු ලියවිලි පහත ලිපිනයේදී කිසිඳු ගෙවීමකින් තොරව පරීක්ෂා කළ හැකිය.

03. මුද්‍රා තබන ලද ලංසු 2024.04.09 දින පෙ.ව.10.00 ට පෙර සභාපති, ප්‍රසම්පාදන කමිටුව, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව, ඉඩම් මහ ලේකම් කාර්යාලය, 'මිහිකත මැදුර', අංක 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ දෙපාර්තමේන්තුවේ ගිණුම් ශාඛාවේ ඇති ලංසු පෙට්ටියට බහාලීමට හැක. ලංසුපත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ " ඩෙක්ස්ටොප් පරිගණක යන්ත්‍ර හා UPS යන්ත්‍ර සැපයීම සහ ස්ථාපනය 2024' යනුවෙන් සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ලියවිලි ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ලංසුපත් භාර ගැනීම 2024.04.09 දින පෙ.ව. 10.00 ට අවසන් වන අතර එම වේලාව ඉකුත් වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට එම අවස්ථාවට සහභාගී විය හැක.

05. වැඩි විස්තර අවශ්‍ය වේ නම් ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ පහත අංක මගින් විමසීමෙන් ලබා ගත හැක.

ගණකාධිකාරී (සැපයීම්) - දුරකථන අංකය 011-2797434

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව,
'මිහිකත මැදුර', අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.
2024.03.